# රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

අංක 1928/28 හා 2015.08.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියේ සහ අංක 2159/11 හා 2020.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 3 වන සේවා ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සඳහා 2025.01.01 දිනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ජ්‍යෙෂ්ඨතාවය මත සුදුසුකම් ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2025.02.20 වේ.

02. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සලකා බලනු ලබන දිනය 2025.01.01 වේ.

03. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

I. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පහත සටහනේ සඳහන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ විෂයයන්ගෙන් කවර විෂයයකට හෝ අයත් විෂයය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ බඳවා ගත් විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. (සටහන 01 හා 02 අදාළ වේ)

IV. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ විධායක සේවා ගණයේ වසර දහඅටකට (18) නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා තිබීම.

VI. අනුමත කාර්යසාධන ඇගයීම් පටිපාටියට අනුව උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

සටහන : 01. සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ සේවයට ඇතුළත් වූ නිලධාරීන් සඳහා විශේෂ අධ්‍යාපනය, අධ්‍යාපන කළමනාකරණය, අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන ප්‍රතිපත්ති, තෘතියික අධ්‍යාපන කළමනාකරණය, පුස්තකාල හා තොරතුරු අධ්‍යාපනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇගයීම් හා පරීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන් අදාළ විෂය ක්ෂේත්‍රයන් වේ.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නව සේවා ව්‍යවස්ථාව ප්‍රසිද්ධියට පත් කරන ලද දිනයට පෙර සම්පූර්ණ කර හෝ අවම වශයෙන් පශ්චාත් උපාධිය සඳහා ලියාපදිංචි වී හෝ ඇති අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබීම ද ඉහත III සුදුසුකම් සපුරාලීම සඳහා සලකා බලනු ලැබේ. එම තොරතුරු සම්මුඛ පරීක්ෂණයේ දී විශ්වවිද්‍යාලයේ / උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයේ ලේඛකාධිකාරී විසින් නිකුත් කළ ලිපියක් මගින් සනාථ කළ යුතුය. මෙම විෂයය ක්ෂේත්‍රයන් විෂයයක් ලෙස ඇතුළත් වන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් ලබා තිබීම ද උක්ත III සුදුසුකම් සපුරාලීම සඳහා සලකා බලනු ලැබේ.

04. උසස් කිරීමේ ක්‍රමය:

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව, සේවයේ විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් සිදුකරනු ලැබේ.

II. 2025.01.01 දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙළ අනුව, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාවට නොඅඩු නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් එම නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පමණක් පරීක්ෂා කරනු ලැබේ.

IV. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරී සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. **අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, 2025.02.20 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලං.අ.ප.සේ. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම" යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ඔබ විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටින අතර දැනට විශ්‍රාම ගෙන සිටියේ වුවද 2025.01.01 දිනට හෝ එදිනට පසු දිනයක් තෙක් සේවයේ යෙදී සිටි සහ උසස්වීමට ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති හා නිවේදනයේ නම් සඳහන් නිලධාරීන් හට මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

07. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ පමණින්ම හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින්ම හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා හිමිකමක් නොවන බව ද වැඩිදුරටත් අවධාරණය කර සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

2025.01. 29

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

අංක 1928/28 හා 2015.08.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියේ සහ අංක 2159/11 හා 2020.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 3 වන සේවා ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරුවල 2025.01.01 දිනට පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ජ්‍යෙෂ්ඨතාවය මත සුදුසුකම් ලැබූ පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. එම්. චන්ද්‍රලේඛා මහත්මිය - අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, හැටන්
2. එස්.ඒ.එන්.පෙරේරා මහතා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පෞද්ගලික පාසල්), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
3. බී.සී.පී. ප්‍රනාන්දු මහතා - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, මීගමුව
4. කේ.ඩබ්. අනුරුද්ධිකා කලහෙවත්ත මහත්මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, අම්බලන්ගොඩ
5. එම්.ඒ.වී.එස්. එදිරිසූරිය මහත්මිය - අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) (රා.ආ), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
6. කේ.කේ.පී. ආරියසිංහ මහතා - අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) (රා.ආ), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
7. ඒ.කේ.එස්.අයි. කුමාරි ලියනගේ මහත්මිය - විභාග කොමසාරිස්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
8. ජේ.ඒ.එම්.පී. ජයතිලක මහත්මිය - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, වයඹ පළාත
9. ඩබ්.ඒ.පී.ජේ. වික්‍රමසිංහ මහතා - විදුහල්පති, තර්ස්ටන් විද්‍යාලය, කොළඹ
10. ජී.එස්. පෙරේරා මහත්මිය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, හලාවත
11. ඒ.එච්.එම්.ජී.ඩී.එස්. සමරකෝන් මහත්මිය - විදුහල්පති, පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර
12. පී. ලියනගේ මහතා - අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
13. ඩබ්.ඒ.එස්.බී. පෙරේරා මහත්මිය - විභාග කොමසාරිස්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
14. කේ.ඒ.ජේ. ප්‍රිෂංගිකා මහත්මිය - අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
15. එස්.එම්.ඩබ්. සමරකෝන් මහතා - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (රා.ආ) - උතුරු මැද පළාත
16. පී.ජී.ආර්.එස්.එම්. වෙලගෙදර මහත්මිය - නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - කෑගල්ල
17. ඩබ්.ඒ.එන්. පෙරේරා මහතා - අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
18. අයි.ඩී.එස්. සිරිබද්දන මහත්මිය - විදුහල්පති, සුජාතා බාලිකා විද්‍යාලය, මාතර

ඒ අනුව මේ සමඟ පළවන නිවේදනයේ විධිවිධාන පරිදි සකස් කරන ලද අයදුම්පත 2025.02.20 දිනට පෙර යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

2025.01. 29

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම
## ආදර්ශ අයදුම් පත්‍රය
### I කොටස

1. (අ) මුලකුරු සමඟ නම :........................................................................................ මයා / මිය / මෙනවිය

   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :............................................................................................

   ...................................................................................................................................

   (ඇ) නම වෙනස් කළේ නම් මීට පෙර භාවිතා කරන ලද නම :.....................................................................

   ...................................................................................................................................

   (නම වෙනස් කර ඇත්නම් පමණි)

2. උපන් දිනය: අවුරුද්ද ....................... මාසය .................. දිනය ............................

3. ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................

4. පෞද්ගලික ලිපිනය : ...............................................................................................

5. දුරකතන අංකය : පෞද්ගලික .......................................... කාර්යාලීය ..........................................

6. දැනට සේවය කරන කාර්යාලය / පාසල : ..........................................................................

7. දැනට දරන තනතුර : ...................................................................................................

8. රාජකාරී ලිපිනය : .......................................................................................................

9. 9.1 පළාත් රාජ්‍ය සේවයට මුදාහැර ඇත්නම් පළාත : ..............................................................

   කලාපය : .................................................................

   9.2 සේවය කරන්නේ ජාතික පාසලක නම් පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය: ...................................

   9.3 විශ්‍රාමික නම් විශ්‍රාම ලත් දිනය : ...........................................................................

10. 10.1 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට පත්වීම් දිනය: ..............................................

    10.2 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ පත්වීම් ලිපියේ අංකය සහ දිනය:-

    ...................................................................................................................................

    10.3 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වීමේ ස්වභාවය: ..............................................................

    (විවෘත / සීමිත / ජ්‍යෝෂ්ඨතා හා කුසලතා / වෙනත් පදනම මත)

    10.4 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගනු ලබන සේවක ගණය: ................................................

    (සාමාන්‍ය සේවක සංඛ්‍යාව / විශේෂ සේවක සංඛ්‍යාව, විශේෂ සේවක සංඛ්‍යාවට අයත් නම් විෂය සඳහන් කරන්න)

    10.5 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ වැඩ භාරගත් දිනය:.........................................

    10.6 පත්වීම ස්ථිර කළ දිනය : .........................................................

11. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කළ දිනය :................................................

    II ශ්‍රේණියේ වැඩ භාරගත් දිනය :.......................................................

12. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කළ දිනය :...................................................

    I ශ්‍රේණියේ වැඩ භාරගත් දිනය : .......................................................

13. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ වසර පහ (05) ක් සම්පූර්ණ වන දිනය: ..........................................

14. උසස්වීමේ පූර්වාසන්න වසර පහ (05) තුළ පෙන්නුම් කර ඇති කාර්යය සාධන මට්ටම:

| වසර | කාර්ය සාධන මට්ටම |
|---|---|
| 2020 | |
| 2021 | |
| 2022 | |
| 2023 | |
| 2024 | |

15. පශ්චාත් උපාධිය පිළිබඳ විස්තර

| උපාධියේ නම | විෂය කරුණු | ලබාගත් ආයතනය | බලපැවැත්වෙන දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වසර 18 නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති, පළමු ශ්‍රේණියේ වැටුප් වර්ධක 05 උපයාගෙන ඇති මා 2025.01.01 දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

දිනය :.........................................                    .....................................................

අයදුම්කරුගේ අත්සන

## II කොටස

**..................................... පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / අතිරේක ලේකම් (අ.සේ.ආ)**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ ......................................................................... මයා / මිය / මෙනවිය සම්බන්ධව I කොටසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදිය.

i. 2025.01.01 දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත / නැත.

ii. 2025.01.01 දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පූර්වාසන්න වසර (05) තුළම සතුටුදායක හෝ ඊට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත / නැත.

උසස්වීමේ පූර්වාසන්න වසර පහ (05) තුළ පෙන්නුම් කර ඇති කාර්යය සාධන මට්ටම:

| වසර | කාර්ය සාධන මට්ටම |
|---|---|
| 2020 | |
| 2021 | |
| 2022 | |
| 2023 | |
| 2024 | |

iii. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීම් ලද .............. / ......... /........ දින සිට 2025.01.01 දින දක්වා අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු ලබා ඇත / නැත.

| වර්ෂය | කාලය | අඩ වැටුප් නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|---|
| | ........... සිට ........... දක්වා | ...... අවු ...... මාස ...... දින | ...... අවු ...... මාස ...... දින |
| | ........... සිට ........... දක්වා | ...... අවු ...... මාස ...... දින | ...... අවු ...... මාස ...... දින |
| | ........... සිට ........... දක්වා | ...... අවු ...... මාස ...... දින | ...... අවු ...... මාස ...... දින |

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 අනුව විනය දඬුවමකට ලක්ව ඇත / නැත.
ශ්‍රී.ලං.අ.ප.සේ. 1 ශ්‍රේණියට උසස්වීමෙන් පසු විනය ක්‍රියාමාර්ග ගෙන ඇත / නැත.

එසේ විනය ක්‍රියාමාර්ග ගෙන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

| වර්ෂය | විනය ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර |
|---|---|
| | |
| | |

**(** චෝදනා පත්‍ර / විනය නියෝග නිකුත් කර ඇත්නම් ඒවායෙහි සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්ය වේ)**

v. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීම් ලද ............... / ......... /........ දින සිට 2025.01.01 දින දක්වා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇත / නැත.
I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක 5ක් උපයාගෙන ඇත / නැත.
වැටුප් වර්ධක විලම්බනය කර ඇත්නම් එසේ කිරීමට හේතු:

| වැටුප් වර්ධක විලම්බන කාලය | හේතුව |
|---|---|
| .................... සිට .................... දක්වා | |
| .................... සිට .................... දක්වා | |
| .................... සිට .................... දක්වා | |

vi. ............... / ......... /........ දින සිට පත්වීම ස්ථිර කර ඇත / නැත.

vii. 2025.01.01 දිනට සේවයේ විධායක සේවා ගණයේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/නැත.

viii. සේවා ව්‍යවස්ථාවේ 10.3.1. (iv) අනුව පශ්චාත් උපාධියක් ලබා ඇත / නැත.

ix. 2025.01.01 දිනට ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇත / නැත.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මෙම නිලධාරියාගේ / නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. ඒ අනුව, මෙම නිලධාරියා / නිලධාරිණිය ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි / නොකරමි.

දිනය :-.......................................  ...............................................................

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අ.සේ.ආ.) / *කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
(අත්සන හා නිල මුද්‍රාව)

* (පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව මුදා හැර ඇති නිලධාරීන් සඳහා)
**නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කරන්න**

**පළාත් අධ්‍යාපන ලේකම්**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියා / නිලධාරිණිය 2025.01.01 දින සිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි / නොකරමි.

දිනය :-.......................................

..................................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(අත්සන හා නිල මුද්‍රාව)

*** නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කරන්න**

**ලේකම්**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ මෙම නිලධාරියා / නිලධාරිණිය 2025.01.01 දින සිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි / නොකරමි.

දිනය :-.......................................

.....................................................
අතිරේක ලේකම් (අ.සේ.ආ) / පළාත් අධ්‍යාපන ලේකම්
(අත්සන හා නිල මුද්‍රාව)

*** නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කරන්න**